## 1.1 හැඳින්වීම

ලෝක නාට්‍ය කලා ක්ෂේත්‍රය තුළ නෝර්වීජියානු ජාතික හෙන්රික් යොහාන් ඉබ්සන් (1828 - 1906) නම් වූ අග්‍රගණ්‍ය නාට්‍යවේදියාගේ ප්‍රවේශය නාට්‍ය කලාවේ තීරණාත්මක සංදිස්ථානයක් විය. නූතනවාදී නාට්‍ය කලාවේ පුරෝගාමී යුග පුරුෂයා ලෙස ගෞරවාදරයට පත් වන ඔහු නූතන යථාර්ථවාදී නාට්‍ය කලාවට මහමඟ විවර කළේය. සැබැවින්ම සමකාලීන නාට්‍ය කලාවේ ආරම්භක පියවර තබන්නේ ඔහුය.

"ඉබ්සන්ගේ අවතීර්ණ වීමත් සමග නාට්‍යය අලුත් ආරම්භයක් ලබයි. ශේක්ස්පියර් හා රසීන්ගෙන් පසු බිහිවුණු ඉතාමත් වැදගත් නාට්‍යකරුවා ලෙස ඉබ්සන් සැලකීමට මේ කරුණ පමණක් ප්‍රමාණවත්ය" යනුවෙන් ජෝර්ජ් ස්ටයිනර් ප්‍රකාශ කරයි. (ජෙනිට, 2006:16) 19 වන සියවසින් උරුම වුණු රෝමාන්තික සම්ප්‍රදායෙන් සහිත දියාරු වූ නාට්‍ය කලාව පෙරළියකට භාජනය කරන්නේ හෙන්රික් ඉබ්සන්ය. ප්‍රපාතයට වැටී තිබූ යුරෝපීය නාට්‍යකලාවට නැවත ජීවය සපයමින් ඔහු නාට්‍ය කලාවේ සෑම අංශයක්ම සම්බන්ධයෙන් නව පිටුවක් පෙරළා ඇත.

කාලයක් පුරාවටම යුරෝපීය නාට්‍යාගාරවල පැවති නාට්‍ය දැක්ම ඉම හෙන්රික් ඉබ්සන්ගේ නිර්මාණ තරංගය හරහා ප්‍රබලව ගිය අපූරු අධ්‍යයනය කිරීමද, අනුවට කාරණයකි. මෙකල බොහෝ නාට්‍ය විචාරකයින්ගේ අදහසට හෙන්රික් ඉබ්සන් ආලෝ වන්නේ යුරෝපීය නාට්‍ය කලාව වෙනත් පැහැදුණු මඟට මුදු තත්ත්වයකට පත් කළ නිසාවෙනි.

ඉබ්සන් නම වස්තු විෂය ප්‍රසාදිත නාට්‍ය ආකෘතිය තුළ ගැබ්කරයි. ඔහුට පූර්ව අවධියේ සිටි විලියම් ශේක්ස්පියර් වැනි ශ්‍රේෂ්ඨ නාට්‍යකරුවන්ද ප්‍රසාදිත නාට්‍ය ආකෘතිය තුළ නම වස්තු විෂයක් ගොතනට සැවද ඉබ්සන්, මිනිස ආධ්‍යාත්මික විප්ලවයේ ගැඹුරු තැන් විග්‍රහයට ලක්කරයි. "ඉබ්සන් අට ප්‍රසාදිත නාට්‍ය ආකෘතිය නම අවසංගය ප්‍රකට කරන සලිය මෙවලමක් බවට හැකි වුයේ ඒ ඔහු තමාගේම නිර්මාණ ආකෘතියක් ස්ථාපිත කිරීම නිසාය. ඉබ්සන් වලෙන, සැබෑ කවියා හැඳින්විය හැක්කේ තමා සැබෑ ලෙස ජීවිතය අත්විඳින යමක් ඒ වේදයිතය ඒ ලෙසම, ඒ සිදුහාවයෙන්ම පාඨකයාට හා ප්‍රේක්ෂකයාට විඳගැනීමට සැලැස්වීමට තරම් කුසලතාවක් ඇති තැනැත්තාට යැයි පැවසිය. ඉබ්සන් තමා ගොඩනගාගත් නාට්‍ය ආකෘතියෙන් උත්සාහ කළේ ම් ආරම්භ ඉක්ම්පාන්ත කරගැනීමටයි." (ජෙනිට, 2005:22)

ඉබ්සන් පරමාදර්ශී 18 වියත් චරිත වෙනුවට පොළව මත පයගසා ජීවත්වෙන චරිත වේදිකාවට ගෙන ආවේය. ඔහු තම නාට්‍ය වලින් මැද පංතියේ ව්‍යාජ හර හා සත්‍යය අතර ගැටුම හෙළි කළේය යන්න සඳහා බෝනික්කි ගෙදර, හෙඩා ගැබ්ලර්, ජන සතුරා යන නාට්‍ය සාක්ෂි දරයි.

බර්නාඩ් ෂෝට අනුව ඉබ්සන් විසින් පිරිමසනු ලබන්නේ ශේක්ස්පියර් විසින් ඉතිරිකර තබන ලද අවශ්‍යතාවයකි. මේ අවශ්‍යතාවය වූ කලී සමාජ චින්තනය එක් පැත්තකිනුත් නවීන රංග ශාලාව අනෙක් පැත්තෙනුත් වශයෙන් පැති දෙකකට බෙදා වෙන්කළ හැකි බවය. සමාජ චින්තනයේ ඉදිරි ගමන සිදුවීම සඳහා ඉබ්සන් විසින් යොදා ගන්නා ලද චරිත වල ඇතුළත හා පිටත ගැටුම් වර්ධනය වූහ. එහිදී කාන්තාවන්ගේ නිදහස්වාදී සටනක් කෙමෙන් දියත්වෙන අයුරු බෝනික්කි ගෙදර, හෙඩා ගැබ්ලර්, සමාජ ඔලුකණු වැනි නාට්‍ය නිර්මාණ වලින් වටහාගත හැකිය. තනි පුද්ගලයා දමිත සමාජය හා ගෙන යන සටන ජන සතුරා, මාස්ටර් බිල්ඩර්, වන තාරාවා වැනි නාට්‍ය මගින් හඳුනාගත හැකිය. රංග ශාලාව පැත්තෙන් බලන කල ඉබ්සන්ගේ නාට්‍ය එකෙක් සෑදූ විරූ ලෙස ප්‍රේක්ෂකයාට ගම්‍ය විය. එමගින් බර්නාඩ් ෂෝ ම පරිදි "නූතනයා අද්‍යතන සමාජයින් ප්‍රේක්ෂකයා නියෝජිත වෙනුවට සෑම යථාර්ථවාදී විද්‍යාවකින් ප්‍රේක්ෂකයා ප්‍රත්‍යක්ෂීකරණය කළ හැකිය" යනුවෙන් සුනන්ද මහේන්ද්‍ර විසින් නොබියෙන ඉබ්සන් සම්බන්ධයෙහි පළකරන ලද ලිපියක සඳහන් වේ.

නව සංකල්ප මෙන්ම නව රංග රීතින් නාට්‍ය ශාලාව තුළට හඳුන්වා දෙමින් පොළව මත පය ගසා ජීවත්වන මිනිසුන්ගේ අභ්‍යන්තර ගැඹුර ගැටුම් වේදිකාව මත විවරණය කරමින් ඉබ්සන් විසින් නාට්‍ය ශාලාවේ නව මංපෙත් හෙළි පෙහෙළි කළේය. ඔහු නූතන නාට්‍ය කලා ඉතිහාසයේ පුරෝගාමී නාට්‍යවේදියා යැයි නම්කරනු ලබන්නේ එම කරුණු පාදක කොට ගෙනය.

ඉබ්සන් විසින් ලියන ලද සෑම නාට්‍යයකම තල දෙකක් ඇති බව මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර පවසයි. එක් තලයක් නම් විවරණාත්මක තලයයි. අනෙක් තලය නම් සංකේතාත්මක තලයයි. "1888 වර්ෂයේ ඉබ්සන් අතින් ලියැවුණු Lady from the sea නාට්‍යය (සුනන්ද මහේන්ද්‍ර විසින් සයුරෙන් ආ ළඳ නමින් නිෂ්පාදනය කොට ඇත.) දැඩි සංකේතාත්මක තලයක ඇති

යථ විචාරකයෝ පවසති. ඔහුගේ ප්‍රථම පරිපූර්ණ නාඩගත් යථාර්ථවාදී නාට්‍යය වන සමාජ කුළුණු නාට්‍යයේ සිටම සංකේත භාවිතය පිළිබඳ සලකුණු හෙළිදරව් වේ.

නාට්‍ය කලාවට අලුත් ආරම්භයක් ලබාදුන් ඉබ්සන්ගේ නාට්‍ය කෘති තුළ දැකගත හැකි ප්‍රධානම ලක්ෂණ බොහොමයක් වන අතර සංකේත භාවිතය ඒ අතර හැඩි පෙනේ. ඔහු තම නාට්‍ය රචනා කාර්යයේදී උදෙසා යොදාගත් ගොඩින් සංකේත භාවිතා කළ අයුරු ඔහු තම ජීවන යුගයේ රචනා කළ මාස්ටර් බිල්ඩර් වැනි නාට්‍ය තුළින් හෙළි කරයි.

ඉබ්සන්ගේ නාට්‍ය, ලෝක නාට්‍ය කලාව තුළ කොතරම් ප්‍රචලිත විද යත් යුරෝපයේ අසීමිත ගිය අදත් සමකාලීන සමාජ විචාරාත්මක සම්භාෂණය පෝෂණය කිරීම නිසා එවන ගණිමට පුළුවන. ඇත්ත වශයෙන්ම ලොව පුරා වැඩි වශයෙන් වාරත්වව නිෂ්පාදනය වන්නේ හෙන්රික් ඉබ්සන්ගේ නාට්‍ය නිර්මාණයන්ය. "එයා සෑම සත්‍යම නිදහසේ ප්‍රයෝජනය කිරීමේ වරම ලැබුණේ 20 වන ශතවර්ෂයේදීය" (කමිලස්, 1989, 214)

නව රංග සංකල්ප නව රංග රීතීන් හඳුන්වා දෙමින් මිනිස් ගැටලු වේදිකාව මත විග්‍රහ කිරීමෙන් ඉබ්සන් නාට්‍ය කලා ලොව සමූහන්ඩයට පත්කලේය. "නිෂ්පාදකයාගේ කාර්ය වඩාත් හොඳට වටහාගත හැක්කේ ඉබ්සන්ගේ නාට්‍ය නිෂ්පාදනය කිරීමෙන් බව විචාරක අදහස විය" (චන්ද්‍ර, 2006,23). මෙම කරුණු අනුව පැහැදිලි වන්නේ ඔහුගේ නාට්‍ය කොතරම් ප්‍රබල මට්ටමක පවතිනවාද යන්නයි.

### 1.2 මාතෘකාව තෝරාගැනීම

මගේ පර්යේෂණ නිබන්ධන මාතෘකාව *"හෙන්රික් ඉබ්සන්ගේ නාට්‍ය සංකේත භාවිතය"* ලෙස තෝරාගැනීම කෙරෙහි කරුණු කිහිපයක්ම හේතු සාධක විය.

මූලික වශයෙන්ම ඉබ්සන්ගේ නාට්‍ය නැරඹීමෙන් හා කියවීමෙන් මම ඉමහත් තෘප්තියක් ලැබුවෙමි. තවද එය හුදෙක් රසවින්දනය පමණක් පදනම් කරගත් එකක් නොව ප්‍රේක්ෂකයාගේ බුද්ධියේ නිම්වළලු පුළුල් කරන්නක් බවද වැටහී ගියේය.